Department of Education, Sabaragamuwa Province/ Weekly School

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල**

**සතිය -**

**විෂය - නර්තනය**

**13 ශ්‍රේණිය**

සැකසීම: එම්.පී.ඩබ්.ආර්.මුතුගල
රෝ/ ගන්කන්ද මධ්‍ය විද්‍යාලය

## I වාරය

නිපුණතාව - 1.0 නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම - 1.2 සාම්ප්‍රදායික ලක්ෂණ ප්‍රදර්ශනය වන සේ වන්නම් නර්තනය කරයි.

ක්‍රියාකාරකම - 1.2 උකුසා වන්නම නර්තනය කරමු.

**ඉගෙනුම් ඵල -**

- අදාළ වන්නම හා සබැඳි පසුබිම හා සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- අදාළ පද කොටස් තාල තබමින් කියයි.
- අදාළ වන්නම් නර්තනය සම්පූර්ණයෙන්ම ඉදිරිපත් කරයි.
- අදාළ වන්නම් වලට අයත් පද තාල තබමින් කියයි.
- නර්තනයේදී නිවැරදි හා සාම්ප්‍රදායික අනන්‍යතාව ප්‍රදර්ශනය කරයි.
- සාමූහිකත්වයෙන් යුතුව වන්නම් නර්තනය ඉදිරිපත් කරයි.
- ශිල්පීය දක්ෂතා ප්‍රදර්ශනය කරමින් වන්නම් නර්තනය ඒකලව ඉදිරිපත් කරයි.

**ශිෂ්‍යා කළයුතු කාර්යයන් -**

- උකුසා වන්නමට අදාළ ශ්‍රව්‍ය පටයක් ආශ්‍රය කොටගෙන අදාළ තාල රූපය හා නාද රටාව අභ්‍යාස කරන්න.
- ගුරුවරයා හා දෘශ්‍ය පට උදව් කරගනිමින් වන්නමට අදාළ මාත්‍රා පුහුණු වන්න.
- සම්පූර්ණ වන්නම අභ්‍යාස කිරීමට උත්සාහ ගන්න.

**ඉහත ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය ඉගෙනුම් ආධාරක -**

- 13 ශ්‍රේණිය නර්තන අතිරේක කියවීම් පොත
- දහඅට වන්නම - සී. ද. එස්. කුලතිලක
- **You Tube** නාළිකාව - https://youtu.be/iZvhTAp5f7c

**ඇගයීම් -**

- උගත් වන්නම තාල තබමින් ගායනා කිරීම
- ගායනා කරන ලද වන්නම බෙර වාදනයට අනුව ඉදිරිපත් කරන්න.
- අදාළ වන්නමෙහි සුවිශේෂ ලක්ෂණ හා තාලය පිළිබඳ අදහස් දක්වන්න.

**පහත ඇගයීම් ද සිදුකරන්න.-**

- සති පාසල් කාර්ය පත්‍රිකාව අංක 03 ස්වයං අධ්‍යාපනයට යොමුවන්න.

**පසු ක්‍රියාකාරකම් -**

- උකුසා වන්නම වේදිකාවකට සුදුසු ලෙස නිර්මාණය කොට පාසල් විවිධ ප්‍රසංගයට ඉදිරිපත් කරන්න.
- මෙම වන්නමට අදාළ ගැළපෙන මාත්‍රා කිහිපයක් ඔබ විසින් නිර්මාණය කරන්න.